# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

# பொலிஸ் ஊடகப் பிரிவு

# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.12.06 පැය 1600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/2177/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## නායයෑම් පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනය සම්බන්ධව.

ආපදා කළමණාකරන මධ්‍යස්ථානය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නායයෑම් පිළිබඳව නිවේදනයක් නිකුත් කර ඇත. ඒ අනුව, පසුගිය කාලසීමාව තුල දිවයිනට බලපෑ අධික වර්ෂාපතනය හේතුවෙන් නායයෑමේ අවධානමක් ඇති ප්‍රදේශ හඳුනාගෙන ඇති බවටද සඳහන් කර ඇත.

ඒ අනුව පහත සඳහන් නායයෑමේ පූර්ව ලක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස දන්වා සිටියි.

- පොළවේ ඇතිවෙන ඉරි තැලීම්, ගැඹුරට හෑරී ඇති පැළුම් හා පොළවේ ගිලා බැසීම්.
- ක්‍රමයෙන් ඇලවී යන ගස්, විදුලි කණු, වැටවල් හා දුරකථන කුළුණු ආදිය.
- ගොඩනැඟිලි වල ගෙබිම සහ බිත්ති මත ඇතිවන පිපුරුම් හා ඒවායේ ක්‍රමික වර්ධනය සම්බන්ධව.
- එක්වර ජල උල්පත් ඇතිවීම හෝ පෙර පැවති ජල උල්පත් බොරවීම, අවහිර වීම හෝ නැතිවීම.

මෙවැනි නායයාමක පූර්ව ලක්ෂණ දක්නට ලැබෙන ප්‍රදේශ වලින් හැකි ඉක්මනින් ඉවත් වීමටත්, අනතුරට භාජනය විය හැකි යැයි අනුමාන කරන පහත ප්‍රදේශ වල ජීවත්වන පුද්ගලයින් වැඩි වශයෙන් පරීක්ෂාකාරීව අවධානයෙන් කටයුතු කරන ලෙසට තවදුරටත් දන්වා සිටියි.

- පහත සඳහන් ප්‍රදේශ වලට ගත වූ පැය 24 තුල 150mm ඉක්මවන වර්ෂාපතනයක් ලැබී ඇති අතර තවදුරටත් වර්ෂාව පවතී නම් නාය යෑම්, බෑවුම් කඩා වැටීම්, ගල් පෙරලීම් පොළව ගිලා බැසීම් සහ පස්කණ්ඩි කඩා වැටීමේ අනතුරුවලින් වැලකීම සඳහා ආරක්ෂිත ස්ථානයක් කරා යෑම සම්බන්ධයෙන් ඉවත් වීමේ රතු නිවේදන නිකුත් කර ඇත.

    - මහනුවර
      (ගඟවත්ත කෝරළය, දෙල්තොට, දොළුව, තුම්පනේ, මැදදුම්බර, මිනිපේ, පාතහේවාහැට, යටනුවර, ගඟ ඉහළ කෝරළේ, අකුරණ, උඩුනුවර, පන්විල, පාතදුම්බර, කුණ්ඩසාලේ, පස්බාගේ කෝරළේ, හතරලියද්ද, උඩුදුම්බර, පූජා පිටිය, හාරිස්පත්තුව, උඩපළාත)

    - කෑගල්ල

(ගලිගමුව, කෑගල්ල, මාවනැල්ල, රඹුක්කන, දෙහිඕවිට, වරකාපොළ, දැරණියගල, බුලත්කොහුපිටිය, රුවන්වැල්ල, යටියන්තොට, අරණායක)

- කුරුණෑගල
  (නාරම්මල, මාවතගම, මල්ලවපිටිය, අලව්ව, රිදීගම, පොල්ගහවෙල)

- මාතලේ
  (රත්තොට, විල්ගමුව, උකුවෙළ, පල්ලෙපොළ, මාතලේ, ලග්ගල පල්ලෙගම, යටවත්ත, නාඋල, අඹන්ගඟ කෝරළය)

- නුවරඑළිය
  (නිල්දණ්ඩාහින්න, වලපනේ, හඟුරන්කෙත, මතුරට)

➢ ගත වූ පැය 24 තුළ පහත සඳහන් ප්‍රදේශවලට 100mm ඉක්මවන වර්ෂාපතනයක් ලැබී ඇති අතර තවදුරටත් වර්ෂාව පවතී නම් නාය යෑම්, බෑවුම් කඩා වැටීම්, ගල් පෙරලීම් පොළව ගිලා බැසීම් සහ පස් කණ්ඩි කඩා වැටීමේ අනතුරුවලින් වැලකීම සඳහා අවධානයෙන් සිට අවශ්‍ය වුවහොත් ආරක්ෂාකාරී ස්ථානයකට යාම සඳහා සූදානම් වීමට දැනුම් දී ඇත.

- බදුල්ල
  (ඌවපරණගම, කන්දෙකැටිය, බණ්ඩාරවෙල, සොරණාතොට, හාලි ඇල, මීගහකිවුල, බදුල්ල, ඇල්ල, හපුතලේ, ලුණුගල, වැලිමඩ, පස්සර, හල්දුල්මුල්ල)

- නුවරඑළිය
  (නුවරඑළිය, අඹගමුව කෝරළය, තලවකැලේ, කොත්මලේ නැගෙනහිර, කොත්මලේ බටහිර)

- රත්නපුර
  (කහවත්ත, ගොඩකවෙල, කොලොන්න)

➢ ගත වූ පැය 24 තුළ පහත සඳහන් ප්‍රදේශවලට 75mm ඉක්මවන වර්ෂාපතනයක් ලැබී ඇති අතර තවදුරටත් වර්ෂාව පවතී නම් නාය යෑම්, බෑවුම් කඩා වැටීම්, ගල් පෙරලීම් පොළව ගිලා බැසීම් සහ පස් කණ්ඩි කඩා වැටීමේ අනතුරුවලින් වැලකීම සඳහා අවධානයෙන් සිටීමට දැනුම් දී ඇත.

- කොළඹ
  (පාදුක්ක, සීතාවක)

- ගාල්ල
  (ඇල්පිටිය, යක්කලමුල්ල)

- ගම්පහ
  (මීරිගම,අත්තනගල්ල, දිවුලපිටිය)

- කළුතර
  (බුලත්සිංහල, ඉංගිරිය, හොරණ)

- මාතර
  (අතුරලිය, පස්ගොඩ)

- මොණරාගල

(බිබිල, මැදගම)

- රත්නපුර
(කිරිඇල්ල, නිවිතිගල, ඇහැලියගොඩ, කුරුවිට, කලවාන, පැල්මඩුල්ල, ඇළපාත, බලංගොඩ, ඕපනායක, ඉඹුල්පේ, අයගම, රත්නපුර, කල්තොට)

ඉහත සඳහන් ප්‍රදේශවල පදිංචි මහජනතාවට ඇතිවිය හැකි අනතුරු අවම කර ගැනීම සඳහා ඉතා විමසිලිමත්ව ක්‍රියා කරන ලෙසටත්, අනතුරට භාජනය විය හැකි යැයි අනුමාන කරනු ලබන ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයින් වැඩි වශයෙන් පරික්ෂාකාරීව කටයුතු කර ආපදා තත්ත්වය කළමණාකරනය කර ගැනීමට කටයුතු කරන ලෙසටත් පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**